**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**சபரகமுவ மாகாண கல்வி திணைக்களம்**
**Sabaramuwa Provincial Department of Education**

| | |
|---|---|
| දෙවන වාර පරීක්ෂණය 2018 | 7 ශ්‍රේණිය |
| மூதலாம் தவணைப் பரீட்சை 2018 | தரம் 7 |
| **Second Term Test 2018** | **Grade 7** |

| | |
|---|---|
| ඉතිහාසය I II | පැය දෙකයි |
| வரலாறு I II | இரண்டு மணித்தியாலம் |
| **History I II** | **Two hours** |

## I කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01 ශ්‍රී ලංකාව කෙරෙහි ඍජු බලපෑම් එල්ල කළ දකුණු ඉන්දියානු රාජ්‍යක් වු පාණ්ඩ්‍ය රාජ්‍යයේ අගනුවර වුයේ

1 කාංචිපුරය 2 තන්ජෝරය 3 මධුරාපුරය 4 කාලිංග දේශය

02 රාජ රාජ නම් චෝල අධිරාජ්‍යයා අනුරාධපුර රාජධානිය ආක්‍රමණය කරන විට එහි සිටි රජතුමා වුයේ

1 V වන මිහිඳු 2 මහා විජයබාහු 3 II වන සේන 4 IV වන මිහිඳු

03 මහා විජයභාහු රජතුමා පිළිබඳව වැදගත් තොරතුරු සඳහන් මුලාශ්‍රයක් වන්නේ

1 අඹගමුව ශිලා ලිපිය 2 තෝනිගල ශිලා ලිපිය 3 බදුලු ටැම් ලිපිය 4 දීපවංශය

04 මහා පරාක්‍රමබාහු රජතුමාගේ මව

1 මිත්තා කුමාරිය 2 ලෝකිතා දේවිය 3 රත්නාවලී කුමාරිය 4 සුගලා දේවිය

05 දළඳා වහන්සේ තැන්පත් කිරිම සඳහා හැටදාගෙය නම් දළඳා මැදුරක් පොළොන්නරුවේ ඉදි කල රජතුමා

1 නිශ්ශංක මල්ල 2 මහා විජයබාහු 3 මහා පරාක්‍රමබාහු 4 V වන මිහිඳු

06 අපගේ සංස්කෘතික උරුමයන් අතරින් අස්පෘෂ්‍ය සංස්කෘතික උරුමයකට නිදසුනක් වන්නේ

1 සීගිරිය 2 පැරණි පොළොන්නරු නගරය 3 දළඳා මාළිගාව 4 ජන කවි

07 හින්දු පොත්පත් වල සඳහන් කෙනෙකුගේ උත්පත්තියේ සිට කෙරෙන සිරිත් විරිත් අතර ''කර්ණවේදය'' යනු

1 කන් විදීමයි 2 නම් තැබිමයි 3 ඉඳුල් කට ගෑමයි 4 අධ්‍යාපනය ආරම්භ කිරිමයි

08 ශ්‍රී ලංකාවේ වෙස් මුහුණු කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශය වන්නේ

1 උඩරට ප්‍රදේශය 2 දුම්බර ප්‍රදේශය 3 අම්බලගොඩ ප්‍රදේශය 4 පිළිමතලාව

09 ක්‍රි ව 2011 දි යුනෙස්කෝ සංවිධානය ලෝක සංස්කෘතික උරුම ලෙස නම් කර ඇති උරුම 704 අතරින් ශ්‍රී ලංකාව පිහිටි සංස්කෘකතික උරුම ගණන

1. 2 කි 2. 8 කි 3. 6 කි 4. 20 කි

10 සිගිරි රාජධානිය ගොඩනැගු රජතුමා වුයේ

1 කාශ්‍යප 2 මුගලන් 3 ධාතුසේන 4 පරාක්‍රමබාහු

අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන් තුලින් තොරා ලියන්න.

(පරාක්‍රමබාහු බුද්ධරාජ රූපවතී ජයගෝප යුනෙස්කෝ)

11 මහා පරාක්‍රබාහු රජුට ළමා කාලයේ සිටම උදවු කළ ප්‍රභුවරයා ..............................ය

12 නිශ්ශංක මල්ල රජතුමා ඉංදියාවේ කාලිංග දේශයේ සිටි ..................................... රජුගේ පුතාය

13 දැදිගම කොට වෙහෙර හෙවත් සුතිඝර චෛත්‍ය ඉදිකර ඇත්තේ ............................ කුමරා උපන් ස්ථානයේය

14 ලෝක සංසකෘතික උරුම ප්‍රකාශයට පත් කරන්නේ ................................ ආයතනය විසිනි

15 පරාක්‍රබාහු රජුගේ බිරිද වූ .................................. බිසව නැටුම් ගැයුම් දක්ෂ කාන්තාවකි

පහත සඳහන් ප්‍රකාශ හරි නම් (✓) ලකුණද වැරදි නම් (×) ලකුණද යොදන්න.

16 ගාලු කොටුව වඩා ශක්තිමත් හා ආරක්ෂිත බලකොටුවක් ලෙස විධිමත්ව ගොඩනංවන ලද්දේ ලංදේසීන් විසිනි ( )

17 සීගිරිය ලෝක උරුම ලැයිස්තුවට ඇතුලත් කර ඇත්තේ 1982 වර්ෂයේදිය ( )

18 ජනකවි ස්පෘෂ්‍ය සංස්කෘතික උරුමයකි ( )

19 නිශ්ශංකමල්ල රජතුමා කාලිංග වංශිකයෙකි ( )

20 පොළොන්නරුවේ කිරි වෙහෙර ඉදිකරන ලද්දේ නිශ්ශංකමල්ල රජතුමා විසිනි ( )

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

01 I ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කරන්න.

1 ඌරාතොට 2 ත්‍රිකුණාමලය 3 පොළොන්නරුව 4 ගාල්ල 5 කලාඔය

(ල.2×5 - 10)

11 (ආ) පිංතුර ප්‍රශ්න 2ක් සහ කෙටි පිළිතුරු ප්‍රශ්න 1ක්

01 II (ආ) පහත සඳහන් පිනතුරය අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



1)මෙම පිනතුරයෙන් දැක්වෙන්නේ කුමක් ද ? ( ල . 1 )

2) මෙහි සඳහන් වරප්‍රසාද ලබා දුන් තැනැත්තාගේ නම කුමක්ද ? (ල. 2 )



(ආ) 1) පිනතුරයෙන් දැක්වෙනව ඓතිහාසික ස්ථානය නම් කරන්න.

2) එය පිහිටා නගරයේ නම ලියන්න

III A - කිරි ලබා ගැන්ම සදහා ඇති කළ ගව දෙනුන් හැදින්වුයේ කුමන නමකින්ද ?

B - වෙළද කණ්ඩායමක් හැදින්විමට අතීතයේ භාවිත කළ නම කුමක්ද ?

C - අත්තානි කණු යනු මොනවාද ?

D - තන්ජෝරය කුමන දකුණු ඉන්දීය රාජ්‍යයේ අගනුවරද ?

02 I පළමුවන විජයබාහු රජතුමා හෙවත් මහා විජයබාහු රජතුාගේ මව හා පියා කවුරුන්ද ? (ල. 2)

II මහ විජයබාහු රජතුමා පිළිබද වැදගත් තොරතුරු සඳහන් මුලාශ්‍ර 1ක් ලියන්න. (ල. 3)

III පළමු වන විජයබාහු රජතුමාගෙන් සිදු වු සේවාවන් 2ක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ල. 5)

03 I මහ පරාක්‍රමබාහු රජතුමාගේ මව පියා කවුරුන්ද ? (ල. 2)

II මහ පරාක්‍රමබාහු රජතුමා කරවු වෙහෙර විහාරස්ථාන 3ක් ලියන්න. (ල. 3)

III මහ පරාක්‍රමබාහු රජතුමාගේ විදේශ ප්‍රතිපත්තිය යටතේ කැපි පෙනෙන සිදුවිම් 2ක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ල.5)

04 I සංස්කෘතික උරුම වර්ග දෙක සඳහන් කරන්න. (ල. 2)

II එම සංස්කෘතික උරුම දෙක කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 3)

III ශ්‍රී ලංකාවේ පිහිටි ලොක සංස්කෘතික උරුම 2ක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

05 I අපගේ සංස්කෘතිය හා සම්බන්ධ උත්සව අවස්ථා 2ක් සඳහන් කරන්න (ල. 2)

II අපගේ සාම්ප්‍රදායික කලා ශිල්ප 3ක් සඳහන් කරන්න. (ල. 3)

III ජනකවි අපගේ සංස්කෘතික උරුමයකි අතිතයේ සිට පැවත එන ඔබ දන්නා එවැනි ජන කවියක් ලියන්න. (ල. 5)

06 I සීගිරිය කරවන ලද කාශ්‍යප රජුගේ පියා සහ සොහොයුරා කවුද ? (ල. 2)

II ජනප්‍රවාදවලට අනුව කාශ්‍යප රජතුමා සීගිරි බලකොටුව ගොඩනැගුවේ ඇයි ? (ල. 3)

III සීගිරි බලකොටුවේ ඇති විශිෂ්ඨ නිර්මාණ 2ක් ලියා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න (ල. 5)

07 I නිශ්ශංකමල්ල රජතුමා පිහිට වු සෙල්ලිපි 2ක නම් ලියන්න. (ල. 2)

II නිශ්ශංකමල්ල රජතුමා ජනතා ශුභසිද්ධිය වෙනුවෙන් අනුගමනය කළ ප්‍රතිපත්ති 3ක් ලියන්න. (ල. 3)

III නිශ්ශංකමල්ල රජතුමා මුහුණදුන් අභියෝග 2ක් ලියා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

